# මගේ කතන්දර පොත

චමත්කා පැහැසරණී



# අපූරු චාරිකාව



# පිදුම

මහමායා බාලිකා
විද්‍යාලයේ 2- E ශ්‍රේණියේ
චාමිණී ගුරු මෑණියන්ටත්
මාගේ දෙමව්පියන්ටත්
මා මේ පොත ඉතා
ගෞරවයෙන් පුදකර
සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිද කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකර ගත් මහමායා දියණියන් වසර ගනනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාදීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරනය කරමින් “දිරිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි.දරුවන්ට අද්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර  විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිරිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබූ අද්දැකිම ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රිර්ථනා කරමි.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරන මණ්ඩලය ගුරුභවතුන් දෙමව්පියන් ආදිශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් නන් අයුරින් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

IS28406

රන්දිගේ පාසලේ සිට මල් වත්තට චාරිකාවක් ගියා. රන්දිට හරිම සතුටුයි. රන්දි බස් රථයට නැග සින්දු කීවා,නැටුවා,සිනාසුනා. බස් රථයෙන් බැස්සා. ඊට පස්සෙ සෙල්ලම් කළා.ගුරුතුමී හැමෝටම ගෙනාපු කෑම කන්න කීවා. පවනි කීවා



හැමෝම කමු කියල. කෑම කාලා ඉවර වුනාට පස්සෙ ගුරුතුමී හැමෝට ම අයිස්ක්‍රීම් බෙද්දා. හැමෝම අයිස් ක්‍රීම් කාලා ඉවර වෙලා සෙල්ලම් කළා, සින්දු කීවා, නැටුවා, පින්තූර ගත්තා. දැන් ටිකක් හවස් වේගෙන ආවා.



හැමෝටම ගුරුතුමී බස් රථයට නගින්න කීවා. හැමෝම බස් රථයට නැග්ගා. බස් රථය ආයෙමත් පාසලට ආවා. බස් රථය නතර කළා. අම්මලා බලා ගෙන හිටියා. හැමෝම අම්මලත් එක්ක ගෙදර ගියා.

# උපන්දින තෑග්ග



රෝසි කියල පුංචි ළමයෙක් හිටියා. මේ පුංචි රෝසිට පුංචි යාළුවෙක් හිටියා.මේ යාළුවගෙ නම පිංකි.

එක දවසක් මේ පුංචි පිංකිගේ උපන් දිනය ආවා.රෝසි මේ පුංචි පිංකිට .තෑග්ගක් දුන්නා. මේ තෑග්ග ලස්සන ලස්සනම ටෙඩි බෙයා



කෙනෙක් දුන්නා. මේ ටෙඩි බෙයා රතුම රතු පාටයි.රෝසි විතරම ලොකුයි. පිංකි හරිම ආසාවෙන් බදා ගත්තා. රෝසිට හරිම සතුටුයි. මේක තමයි මම ආසම උපන්දින තෑග්ග.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීමතුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිද පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි.ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැංවී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සමපාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශණය කෙරෙන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමණයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘයේ ජීවය වූයේ මහාමාභා දියණායන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමාභා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකුවීමට ශක්තිය ලැබේවායි පතමි.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යෙමුකලව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.0

# ස්තූතිය

මා හට මෙම පොත
නිර්මාණය කිරීම
සඳහා උදව් උපකාර
කළ මාගේ
දෙමව්පියන් ඇතුළු
සියළු දෙනාට මාගේ
ස්තූතිය පුද කර
සිටිමි.

IS28406